**ජල සම්පත් මණ්ඩලය - 2020**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------

ජල මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරි සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන ස්ථානයට අදාළ බදු මුදල් නොගෙවීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් මණ්ඩලයට එරෙහිව නඩුවක් පවරා තිබුණ ද, එම නඩුව මඟින් පැනනැගිය හැකි අසම්භාව්‍ය බැරකම පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2021 වර්ෂයේදී මේ සඳහා අසම්භාව්‍ය බැරකම් පවතී නම් ගිණුම් ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | රාජ්‍ය අංශ ගිණුම් කරන ප්‍රමිත අංක 3 ප්‍රකාර ඉකුත් වර්ෂයේ වූ දෝෂ නිවැරදි කිරිමේදී පෙර වර්ෂ ලාභ ශේෂයට ගැලපිය යුතුව තිබුණද ඉකුත් වර්ෂයේ | එකඟ වෙමි | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 අනුව කටයුතු කළ යුතුය. |

ගොඩනැගිලි අලුත්වැඩියාව වෙනුවෙන් දරන ලද රු.208,872 ක වියදම වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.208,872 කින් වැඩියෙන් දැක්වුණි.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වේලි ආරක්ෂණ හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය මගින් 2018 වර්ෂයේ රු.13,261,884 ක් වැයකර ඉදිකර ජල සම්පත් මණ්ඩලයට භාර දී තිබූ උතුරුමැද ප්‍රාදේශීය කාර්යාලයේ රසායනාගාර ගොඩනැගිල්ල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | කුළී හා බදු පදනම මත පවතින මණ්ඩලයට පවරා නොගත් ඉඩම් වල විවිධ ප්‍රදාන යටතේ ඉදි කරන ලද ගොඩනැගිලි ගිණුම්ගත කිරීම සිදු නොකිරීම නිසා මෙම තත්වය ඇති වී තිබේ. කෙසේ වුවද 2021 වර්ෂයේ ගිණුම් ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීමේදී මේ සම්බන්ධව සටහන් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ගිණුම් පිළියෙල කළ යුතුය. |

### 1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රත්මලාන ගබඩාවේ වර්ෂ 03 ක කාලයක සිට භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවති රු.7,154,105 ක් වූ ජල පොම්ප 25 ක්, විදුලි ජනක යන්ත්‍ර 10 ක් සහ ඊට සම්බන්ධ අනෙකුත් උපකරණ 2020 සැප්තැම්බර් 03 දින වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණි. උපකරණ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට පාලක මණ්ඩලයේ අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. | වාරිමාර්ග විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී හා ජල සම්පත් මණ්ඩල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී මේ සම්බන්ධව නිරන්තර සාකාච්ඡා කළ අතර ඒහි නියෝග පරිදි කමිටුවක් ස්ථාපනය කර කමිටු නිර්දේශ මත මෙම උපකරණ වාරිමාර්ග අමාත්‍යාංශයට ලබා දීමට කටයුතු කර ඇත.<br>මේ සම්බන්ධව පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොමැති අතර ඉදිරියේදී ආවරණ අනුමැතිය ලබාගැනීමට කටයුතු සූදානම් කර ඇත.<br>මෙම උපකරණ ඉතාමත් නිවැරදි | ආයතනය සතු වත්කම් ඉවත් කිරීමේදී ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත යුතුය. |

ආකාරයට වාරිමාර්ග අමාත්‍යාංශයට ලබා දීමට කටයුතු කර ඇති අතර අවශ්‍යනම් එම තොරතුරු ඉදිරිපත් කළ හැක.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට රු.6,683,106 ක් වූ ණය ගැති ශේෂයක් වූ අතර ඉන් රු.2,320,606 ක ණය ගැති ශේෂ වර්ෂයකට වඩා පැරණි ඒවා විය. | ණයගැති ශේෂ තහවුරු කිරීමේ ලිපි සියළුම ආයතන වෙත යවා ඇති අතර 2020 දෙසැම්බර් 31 දිනට වසරකට වඩා කල්ගත වූ රු.2,320,606.00 ක ශේෂය රාජ්‍ය ආයතන 02 කින් ලැබිය යුතුව පැවති මෙම ණයගැති ශේෂ ඉක්මනින් නිරවුල් කර ගැනීමට මේ වන විටත් අවධානය යොමු කර ඇත. | ණය ශේෂ අයකර ගැනීම යාවත්කාලීනව සිදු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට සේවා අත්තිකාරම් ලෙස රු.18,897,123 ක් ගෙවා තිබුණද ඉන් රු.1,116,328 ක අදාළ සේවාවන් වර්ෂයකට අධික කාලයක සිට සපයා නොතිබුණි. | සේවා අත්තිකාරම් ගිණුමේ වර්ෂයකට වඩා පැවති රු.1,116,328 ක ශේෂය 2021 අප්‍රේල් 30 දින වන විට රු.379,592 දක්වා අඩු වී ඇත. ආයතන 04 ක් වෙනුවෙන් පවතින එම ශේෂයද නිරවුල් කිරීමට අවධානය යොමු කර තිබේ. | අදාළ කාර්යයන් නිම කර අත්තිකාරම් ආදායම් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | අංක 2010/23 සහ 2017 මාර්තු 16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය | (i) | කෘෂිකාර්මික කටයුතු සඳහා ඉදි කරනු ලබන විශ්කම්භය මීටර් 4 ක් හෝ ඊට වැඩි වගා ළිං, වානිජමය කෘෂිකාර්මික කටයුතු සහ කර්මාන්ත අවශ්‍යතා සඳහා ඉදි කරනු ලබන නළ ළිං සඳහා ජල සම්පත් මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. තවද නළ ළිං ඉදිකරන සියළු ආයතන මණ්ඩලයේ ලියාපදිංචි විය යුතු වුවත් ඇතැම් ආයතන එසේ ලියාපදිංචි වී නොතිබුණි. | 2010/23 සහ 2017.05.16 දිනැති ගැසට් පත්‍රයට අනුව භූගත ජල නිමාන කටයුතු විධිමත් කර පවත්වා ගෙන යාම සඳහා පහත සඳහන් අංශ වැඩිදියුණු කිරීමට කටයුතු යොදා ඇත.<br>1. රෙගුලාසි වලට අනුකූලව කටයුතු නොකරන අවස්ථා වලදි නිතිමය ක්‍රියාමාර්ග ගැනීමට ජල සම්පත් මණ්ඩල පනතෙහි ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. ඒ | නීතිරීති රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| | | (ii) | වාණිජමය කෘෂිකර්මාන්තය සඳහා හෝ කර්මාන්ත සඳහා මසකට ලීටර් 30,000 ක භූගත ජලය ලබා ගන්නා සියළුම ව්‍යාපෘති සඳහා අදාළ ජල ප්‍රභවය සම්බන්ධ තත්ත්ව වාර්තා නිකුත් කර නොතිබුණි. | අනුව කැබිනට් අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමින් පවතී. කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම හේතුවෙන් අදාල කටයුතු විධිමත්ව සිදු කිරීමට නොහැකි වී ඇත. එම නිසා පුරප්පාඩු පිරවීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. එමඟින් ජල සම්පත් කළමණාකරනයට අදාලව රාජ්‍ය වගකීම දීප | නීතිරීති රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. |
| | | (iii) | ගැසට් පත්‍රයේ 3 වගන්තිය ප්‍රකාරව අදාළ විශ්ලේෂණ වාර්තා අනුමැතිය සඳහා ජල සම්පත් මණ්ඩලය වෙත ලබා | ව්‍යාප්ත සහ තිරසාරව සිදු කිරීමට කටයුතු සම්පාදනය කර ඇත. දැනට පවතින රාජ්‍ය යාන්ත්‍රණය සැලකිල්ලට ගෙන දිස්ත්‍රික් ලේකම්, | නීතිරීති රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම්, ජල සම්පාදන මණ්ඩලය, ප්‍රජා ජල දෙපාර්තමේන්තුව යන ආයතන සම්බන්ධීකරණයෙන් | |
| | | (iv) | ගැසට් නිවේදනයේ 2 වගන්තිය අනුව දෛනිකව ලබාගන්නා ජල පරිමාණයන් පිළිබඳ දත්තයන් පවත්වාගත යුතු වුවත් ඇතැම් පෞද්ගලික ආයතනයන් එසේ කටයුතු කර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් මණ්ඩලය කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | භූගත ජල මූලාශ්‍ර වල තොරතුරු රැස් කර ගැනීමට කටයුතු සම්පාදනය කර ඇත. ඒ අනුව දැනට එම දත්ත ජල සම්පත් මණ්ඩලයවෙත ලැබෙමින් පවතී. මෙම දත්ත විශ්ලේෂණය කර වගා ලිං, වාණිජමය, කෘෂිකාර්මික, කර්මාන්ත අවශ්‍යතා සඳහා භාවිතා කරන නල ලිං හඳුනා ගැනීමට කටයුතු කරමි. ඒ අනුව නියාමන කටයුතු තවදුරටත් විධිමත්ව පවත්වාගෙන යාමට කටයුතු සැලසුම් කොට ඇත.<br><br>- එම - | නීතිරීති රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | අංක 2010/23 සහ 2017 මාර්තු 16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය<br><br>i. නියෝග අංක 2 | | නළ ලිං ඉදිකිරීමේ නියැලෙන සියලු ආයතන ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි වියයුතු අතර මණ්ඩලයේ උපදෙස් පරිදි අදාල ආයතන විසින්ම ජල මනු සවිකර ගත යුතු වුවත් එසේ නළ ලිං මගින් භූගත ජලය ලබාගන්නා ආයතන 256 ක් ජල මනු සවිකර නොතිබුණි. | - එම - | නීතිරීති රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii.නියෝග අංක 3 | ජලය බෝතල්කිරීමේ කර්මාන්තයෙහි හා බීම නිෂ්පාදනයෙහි නියැලෙන මොනයම් හෝ රාජ්‍ය හෝ පලාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් හෝ අයතනයක් හෝ පුද්ගලයෙකු ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජලය සිය නිෂ්පාදන කටයුතු සඳහා උපයෝගී කරගනු ලබන්නේනම් එකී ජල මූලාශ්‍රයේ ජල නියැදියන් සෑම මාස 6 කට වරක් රජයේ පිළිගත් රසායනාගාරයකින් පරීක්ෂාවක් සිදුකර අදාළ විශ්ලේෂණ වාර්තාව අනුමැතිය සඳහා ජල සම්පත් මණ්ඩලය වෙත ඉදිරිපත් කලයුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | | නීතිරීති රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. |
| iii.නියෝග අංක 5 | ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජලය උපයෝගී කරගනිමින් නිෂ්පාදන හෝ සේවා කටයුතු සිදුකරනු ලබන ආයතන වෙත ඇතුලු වී පරීක්ෂා කළ යුතුව තිබුණද, මණ්ඩලය තුළ ලියාපදිංචි වී තිබූ පානීය ජල බෝතල් කිරීමේ කර්මාන්තශාලා 22 කින් කර්මාන්තශාලා 7 ක් පමණක් පරීක්ෂා කර තිබුණි. | - එම - | නීතිරීති රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II පරිච්ඡේදය 2.1 වගන්තිය | ආයතනය විසින් බඳවා ගැනීමේ පරිපාටි සකස් කොට අනුමත කර ගැනීමකින් තොරව තනතුරු 06 ක් සඳහා නිලධාරීන් 07 දෙනෙකු 2017 හා 2018 වර්ෂයන්හි දී බඳවාගෙන තිබුණි. | මෙම තනතුරු 06 සඳහා බඳවා ගැනීමේ පටිපාටි සකස්කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. | ආයතන සංග්‍රහයේ රෙගුලාසවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.12,059,000 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.41,201,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.53,260,000 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයේ අදායමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 80,254,000 කින් අඩුවී තිබීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 අනාර්ථික ගනුදෙනු

--------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | -------------------------------- | ----------- |
| ප්‍රධාන කාර්යාලය භූමියේ විද්‍යාගාරයක් ඉදිකිරිම සඳහා ගොඩනැගිලි සැලැස්මක් පිළියෙල කිරිම වෙනුවෙන් මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය (CECB) වෙත 2015 වර්ෂයේදී රු.300,000 ක මුදලක් ගෙවා තිබුණි. ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩමේ අයිතිය මණ්ඩලය සතුව නොමැතිවිම හේතුවෙන් එම විද්‍යාගාර ගොඩනැගිල්ල ඉදි කර නොතිබුණි. ඒ අනුව අදාල වියදම නිශ්කාර්ය වී තිබුණි. | ප්‍රධාන කාර්යාල භූමියේ රසායනාගාරයක් ඉදි කිරීම සඳහා වූ සැලැස්ම වෙනුවෙන් දරන ලද රු. 300,000.00 ක මුදල එම කාර්යය අත්හිටුවීමට සිදු වීම හේතුවෙන් ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග සඳහා මේ වන විට අධ්‍යක්ෂ මණ්ඩල අවධානයට යොමු කර තිබේ. | නිෂ්කාර්යය වියදම් සම්බන්ධයෙන් කළමනාකරයේ අවධානය යොමු විය යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී කෘෂි ළිං සමීක්ෂණ 500 ක් සිදු කිරීමට සැලසුම් කර තිබුණ ද වර්ෂය අවසානය වන විටත් කිසිදු කාර්යයන් ඉටු කර නොතිබුණි. | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්‍ෂ ජනරාල් තුමාගේ ඉල්ලීමට අනුව එම ආයතනය මගින් සැලසුම්කරණ ලද මහවැලි රඹකැන් ඔය කලාපයේ (අම්පාර දිස්ත්‍රික්කයේ) කෘෂිකර්ම කටයුතු වියළි කාලයේ පවා අඛණ්ඩව පවත්වාගැනීම හා විශේෂ කෘෂි කලාපයක් ඇතිකිරීම සඳහා වගා ළිං ඉදිකිරීමේ ව්‍යාපෘති යෝජනාවක් ජල සම්පත් මණ්ඩලය මගින් සකස්කර ඉදිරිපත් කරන ලදී. එම ව්‍යාපෘති යෝජනාව නිම කිරීමේ අරමුණින් මණ්ඩලයේ 2020 ක්‍රියාකාරී සැලැස්මට මෙය ඇතුළත්කර කෘෂි ළිං ඉදිකිරීමට හූ ජල සමීක්ෂණ 500 ක් සිදුකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ උවද 2020 වර්ෂය තුල මහවැලි අධිකාරිය මගින් මෙම ව්‍යාපෘතියට අදාල ප්‍රතිපාදන මණ්ඩලය වෙත ලබා නොදීම හේතුවෙන් සැලසුම්කල පරිදි ව්‍යාපෘතිය සිදුකිරීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජල සම්පත් මණ්ඩලය විසින් දීර්ඝ කාලයක සිට භාවිතා කරන රත්මලාන වැඩ බිම හා ගබඩාව පිහිටි ඉඩම, අනුරාධපුර සංචාරක නිවාසය සහ වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි ඉඩම පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | රත්මලාන වැඩබිම හා ගබඩාව පිහිටි ඉඩම වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නාගරික සංව(ර්ධන අධිකාරියට පවරා ඇත. නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට කටයුතු සංවිධානය කරමින් පවතින බැවින් මණ්ඩලයට විකල්ප ඉඩමක් ලබාදීමට එකඟවී ඇත. | මණ්ඩලය භාවිතා කරන බාහිර ආයතන සතු වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අනුරාධපුර සංචාරක නිවාසය දිගු කාලීන බදු පදනම මත වසර 30 ක කාලයකටෙමණ්ඩලයට පවරා ඇත. ප්‍රාදේශීය කාර්යාලයක් වශයෙන් වව්නියාව ඉඩමේ ගොඩනැගිල්ලක් පවත්වාගෙන යනු නොලබන අතර වව්නියාව ප්‍රදේශයේ නල ළිං විදුම් කටයුතු සිදුකරන අවස්ථාවලදි කාර්ය මණ්ඩලය සඳහා නවාතැන් දීම සඳහා තාවකාලිකව ගොඩනැගිලි ඉදිකර පවත්වාගෙන යනු ලබයි. | |
| (ඇ) | 2016 දෙසැම්බර් 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නාගරික සංවර්ධන අධිකාරියට අයත් බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතෙහි පිහිටි පර්චර්ස් 40 ක ඉඩම රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තිරණය කරනු ලබන නාමික බදු කුලියක් අය කිරිමේ පදනමින් අවුරුදු 30 ක කාලසිමාවකට ජල සම්පත් මණ්ඩලය වෙත ලබාදීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබුණි. ප්‍රධාන තක්සේරුකරු විසින් 2020 ඔක්තෝබර් 20 දින එකී ඉඩම සඳහා වාර්ෂික බදු කුලිය රු.2,700,000 ක් ලෙස තීරණය කර තිබුණි. එසේ වුවත් ආයතනය විසින් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නාමික බදු කුලියක් ලෙස වාර්ෂික බදු කුලියට අඩු වටිනාකමක් ගෙවීමට අවස්ථාව පැවතියදී වාර්ෂික බදු කුලී වටිනාකම ගෙවීම් කිරීමට කටයුතු කර තිබුණි. | මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩමද රජයට අයත් එකකි. ඒ වෙනුවට බත්තරමුල්ලේ ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතෙහි පිහිටි පර්චස් 40 ක ඉඩම වාර්ෂික නාමික බිම් කුලී මුදලක් මත 30 අවුරුදු බදු පදනම යටතේ මණ්ඩලයට ලබාදීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රධාන තක්සේරුකරු වෙත දැන්වීමෙන් පසු අදාල වාර්ෂික බිම් කුළිය ගෙවන ලෙස දන්වන ලදී. | මණ්ඩලය බාහිර පාර්ශවයන් සමග ගිවිසුම්ගත වීමේදී උපරිම ප්‍රතිලාභ ලැබෙන ලෙස එය සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නෙදර්ලන්තයේ විශේෂ ණය ආධාරයන් යටතේ ක්‍රියාත්මක භූගත ජල සමීක්ෂණ ව්‍යාපෘතිය යටතේ මධ්‍යම දත්ත මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2016 වර්ෂයේදී ලබා දී ඇති ප්‍රතිපත්තිමය තීරණය ලබා දී තිබුණි. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියට අයත් බත්තරමුල්ලේ පිහිටි ඉඩමක, ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ඉඩම බදු ගැනිමට අදාල බදු ගිවිසුමකට එළඹීම ප්‍රමාද වීම හේතුවෙන්, ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ගිවිසුම අනුව අදාළ ගොඩනැගල්ල ඉදිකිරීමේ කටයුතු 2021 වර්ෂයේදී නිමකිරීමට නොහැකි වී තිබුණි. එසේ වුවත් ගොඩනැගිල්ල ඉදි නොකර ගිවිසුමෙන් දක්වා ඇති (Trunkey contract ) පරිදි ගෙවීම් කිරීමට සිදුවීම හේතුවෙන් රසායනාගාරය ඉදිකිරීම් පිරිවැය ලෙස එකඟ වී ඇති රු.මිලියන 95 ක මුදල ද ගොඩනැගිල්ල ඉදිකිරීමකින් තොරව ගෙවීම් කිරීමට සිදුවීමේ අවදානමක් පැනනැගී ඇත. | අදාළ බත්තරමුල්ලේ ඉඩමේ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකාච්ඡා වාර කිහිපයක් පැවැත්වීමට සිදුවූ නිසා විශාල කාල ප්‍රමාදයක් සිදුවිය.<br>පසුව විෂයභාර අමාත්‍යවරයා සහ අමාත්‍යාංශ ලේකම්තුමා මැදිහත් වී ඉඩම සඳහා ගෙවිය යුතු බදු පිළිබඳව ඒකඟතාවයකට පැමිණි අතර මෙම ඉඩමේ ගොඩනැගිල්ල ඉදිකිරීමට කැබිනට් අනුමැතිය ලබා ගැනීමටද කාලයක් ගතවිය.<br>දැනට මූලික වැඩ කටයුතු අවසන් වී ඇති බැවින් කැබිනට් අනු කමිටු අනුමැතිය අධ්‍යාක්ෂ මණ්ඩලයට යොමුකළ යුතුව ඇත.<br>කොවිඩ් 19 වසංගත තත්වය මත විදේශීය නියෝජිතායතන නිළධාරීන්ට ලංකාවට පැමිණීම ප්‍රමාද වීමද මෙම කටයුතු වලට බලපා ඇත. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු තර මණ්ඩලයට උපරිම ප්‍රතිලාභයන් ලැබෙන සේ කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ සිදු කරන ලද තොග සමීක්ෂණ වාර්තාව අනුව වර්ෂ 05 කට අධික කාලයක සිට නිකුත් කිරිමකින් තොරව ගබඩාවේ පැවති රු.1,010,809 ක් වූ තොගයෙන් රු.770,060 ක් වූ තොග අපහරණය | වටිනාකම රු.1,010,809.00 ක් සඳහන්ව ඇති නිකුත් කිරීමකින් තොරව පවතින ඉතිරි තොග සැලකීමේදී යන්ත්‍ර සූත්‍ර උපකරණ අමතර කොටස් වලින් රු.394,088 ක තොග අපහරණය කිරීම සඳහා දැනටමත් කටයුතු කර ඇත. අනිකුත් යන්ත්‍ර අමතර කොටස් වෙළඳපලේ මිලදී | නිකුත් කිරීමකින් තොරව ගබඩාවේ දීර්ඝ කාලයක සිට පවතින තොග හඳුනාගෙන ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීමකින් තොරව ගබඩාවේ රඳවාගෙන තිබුණි. | ගැනීමට නොමැති බැවින් රඳවා තබා ගැනීමට සිදුව ඇත.<br>මෙයට අමතරව ඉතිරි ලිපි ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය හා භූගත ජල සමීක්ෂණ තොග වලින් අපහරණය කල හැකි ද්‍රව්‍ය හඳුනා ගෙන ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | |
| (ඊ) | පලෙයි කාර්යාල ගොඩනැගිල්ලේ තිබූ රු.118,000 වටිනාකමකින් යුත් භාණ්ඩ අස්ථාන ගත වී ඇති බව 2018 ඔක්තෝම්බර් 16 දින හඳුනා ගෙන තිබුණි. ඊට අදාල පරීක්ෂණය මේ දක්වාම සිදු කර නොතිබුණි. | පරීක්ෂණ කටයුතු අවසන් කර ඇති අතර වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ඇත. අධ්‍යක්ෂක මණ්ඩලය ඉල්ලා සිටි අමතර තොරතුරු ඊලඟ අධ්‍යක්ෂමණ්ඩලයට යොමුකිරීමට කටයුතු කර ඇත. | අස්ථානගත වූ භාණ්ඩවලට අදාළව විධිමත් පරීක්ෂණයක් සිදු කර අලාභය අය කර ගැනීමට හෝ අවශ්‍ය පියවර ගත යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය සතුව බැරලෝහ විශ්ලේෂණයට හා භූගත ජලයේ කෘෂිරසායන පරීක්ෂාවට උපකරණ නොමැතිවීම සහ උතුරුමැද කලාපයේ පැවති හඳුනානොගත් දිගුකාලීන වකුගඩු ගැටළු සඳහා ජලයේ විස්තරාත්මක විශ්ලේෂණ කටයුතු සිදුකිරීම සඳහා 2018 වර්ෂයේදී වේලි ආරක්ෂණ හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය විසින් රු.13,261,884 ක් වැය කර රසායනාගාරයක් ඉදිකර ඊට | GC-MS/MS උපකරණ ඇතුළු අනෙකුත් අධි තාක්ෂණික උපකරණ සඳහා 2019 ජනවාරි, 2019 ජූලි පුහුණු සැසියන් පවත්වනු ලැබූ අතර ඒ වන විට මෙම උපකරණ ක්‍රියාත්මකව තිබුණි. මෙම උපකරණ සැපයූ ආයතනය විසින් 2020 දෙසැම්බර් මස සිදුකරනු ලැබූ වාර්ෂික සේවාවන්හි එම උපකරණයෙහි යම් කොටසක දෝෂ සහගත තත්වයන් මතුව ඇති බව ඔවුනගේ සේවා වාර්තා වලින් තහවුරු වුණි. ඒ බව කළමනාකාරීත්වයට යොමු කිරීම හරහා එම උපකරණයෙහි දෝෂය මඟ හරවා ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයකට යොමු වීම අවශ්‍ය බව පෙන්වා දෙන ලදි. | වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.95,095,235 ක උපකරණ ලබා දී තිබුණි. එම උපකරණ වලින් භූගත ජලයේ කෘෂි රසායනයන් අඩංගු වීම විශ්ලේෂණය කිරීම සඳහා රු.මිලියන 32,555,430 ක් වැය කර මිලදී ගෙන තිබූ GC-MS/ms උපකරණය සැපයූ දින සිට අක්‍රීය තත්ත්වයේ තිබුණි. වගකීම් කාලය තුළ සැපයුම්කාර සමාගම වෙත ඒ පිළිබද දැනුවත් කර පිළිසකර කිරීමට කටයුතු කර නොතිබුණි. ඊට වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීම සඳහා කිසිදු පරීක්ෂණයක් සිදු කර නොතිබුණි. | මේ වනවිට එම උපකරණයෙහි දෝෂ සහගත කොටස සම්බන්ධවූ විශ්ලේෂණ කටයුතු හැරෙන්නට අනෙකුත් කෘෂි රසායන කාණ්ඩයන් විශ්ලේෂණ කිරීම එම උපකරණ හරහා සිදුකල හැකිබව එම උපකරණ සැපයූ ආයතනය විසින් පෙන්වා දෙන ලදී. ඒ අනුව මෙම උපකරණයෙහි එම කොටසෙහි දෝෂය අලුත්වැඩියා කිරීම සඳහා පත්කරනු ලබන තාක්ෂණික කමිටු නිර්දේශයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මගින් සිදු කිරීමට කළමනාකාරිත්වය විසින් සැලසුම් කොට ඇත. ජල විශ්ලේශක තනතුරු බඳවා ගැනීම් සිදුකල පසු උපකරණයේ විශ්ලේෂණ කටයුතු කල හැකි කාණ්ඩ වල විශ්ලේෂණ කටයුතු පවත්වාගෙන යාමට සැලසුම් කර ඇත. | |
| (ආ) | රසායනාගාර උපාංග භාවිතය පිළිබඳව මණ්ඩලයේ නිලධාරීන් 10 දෙනෙකු වෙත අවශ්‍ය පුහුණුව ලබා දී තිබුණ ද නිලධාරීන් දෙදෙනෙකු පමණක් සේවයට අනුයුක්ත කර තිබුණි. රසායනාගාරය මගින් කළ හැකි පරීක්ෂණයන්ගේ ස්වභාවය හා උපරිම හා අවම ධාරිතාවයන් පුරෝකථනය කර නොතිබුණි. එසේම රසායනාගාරය මගින් සපයන රසායනාගාර පහසුකම් පිළිබද දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි. ඉකුත් මාස 18 ක කාලය තුළ | රසායනාගාරයේ කාර්ය මණ්ඩල හිඟය මත අවශ්‍ය කරනු ලැබූ විශ්ලේෂණ කටයුතු කරගෙන යාමේ දුෂ්කරතාවයන් මත උපකරණ වල උපරිම ධාරිතාවය යටතේ විශ්ලේෂණ කටයුතු සිදු නොවුනද ව්‍යාපෘති සහ වාණිජමය විශ්ලේෂණ කටයුතු හැකි උපරිම අයුරින් සිටින රසායනාගාර කාර්ය මණ්ඩලය හරහා සිදු කරන ලදී. ජල විශ්ලේෂක තනතුරු සඳහා බඳවා ගත් පසු මෙම කටයුතු වඩා කාර්යක්ෂම වනු ඇත. මෙම රසායනාගාරය උතුරු මැද පළාතෙහි SLAB තත්ව යටතේ ඇති රසායනාගාරයක් ලෙස ස්ථාපනය කිරීමේ ක්‍රියාදාමය ජර්මානු තාක්ෂණික සහයෝගිතා වැඩසටහන යටතේ සිදුවේ. එමඟින් උතුරු | වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| භූගත ජලයේ බැර ලෝහ පරීක්ෂා කිරීමේ පරීක්ෂණ 950 ක් පමණක් සිදු කර තිබුණි. | මැද පළාතේ රසායනාගාර කාර්ය මණ්ඩලයේ හැකියාවන්ද(Skill Development) පුහුණු සැසියන් සහ වැඩමුළු මෙම රසායනාගාරයද කේන්ද්‍ර කොට සිදු කිරීම මඟින් මෙම රසායනාගාරය පිළිබඳ අදාල පාර්ශවයන් දැනුවත්වීම සිදුකෙරෙමින් පවතී. | |

## 3.4 වාහන පද්ධතිය කළමනාකරණය

----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයට අයත් වාහන 30 ක් සඳහා වාහන පවතින ස්ථාන හඳුනාගැනීමේ යන්ත්‍ර සපයා සවිකිරීම (Supplying & Installation of vehicle tracking Solution) සඳහා රු.1,419,000 ක වටිනාකමකට 2019 සැප්තැම්බර් 18 දින ගිවිසුමකට එළඹ තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙතෙක් මුදල් කිසිවක් ගෙවා නොමැති අතර, අදාල උපකරණ සවිකල ආයතනය, අප විසින් ඉල්ලුම් කල ආකාරයට කටයුතු කර නොමැති බැවින් සවිකල උපාංග ඉවත් කර ගැනීමට දැනුම් දී ඇත. | කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව අවශ්‍ය කාර්යයන් කොන්ත්‍රාත්කරු ලවාම ඉටු කරවා ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------

### 4.1 අයවැය පාලනය

----------------

| විගණන නිරීක්ෂණය<br>----------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>---------------------------------- | නිර්දේශය<br>----------- |
| --- | --- | --- |
| අයවැය ලේඛණය මණ්ඩලයේ මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය සදහා ඉදිරිපත් කරන ලද අයවැය ලේඛණය මඟින් වෙන් කරන ලද වියදම් සීමාවන් ඉක්මවා වියදම් දරා තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව එසේ වැය කර ඇති සීමාවන් ඉක්මවා වියදම් දැරීම සියයට 16 සිට සියයට 840 ක පරාසයක පැවතුණි. | සමස්තයක් ලෙස ගත් විට පරිපාලන පිරිවැය, සැපයුම් පරිභෝජනය, වෙනත් මෙහෙයුම් වියදම්හි පාලනයක් පැවතුණි. කොන්ත්‍රාත්ගත සේවා හා නඩත්තු වියදම්හි වැඩිවීමක් පෙන්නුම් කරනු ලැබ ඇත්තේ ගොඩනැගිලි කුලී වියදමෙහි තක්සේරු දැන්වීම් ප්‍රමාද වී ලැබීම හේතුවෙනි. කෙසේ වුවද හැකිතරම් දුරට තවදුරටත් වියදම් පාලනය කෙරෙහි අවධානය යොමු කර තිබේ. | අයවැයගත වියදම් ඇස්තමේන්තු සීමා ඉක්මවා කටයුතු නොකළ යුතුය. |